30)

PERMANENT
REFERENCE
NOT TO BE
REMOVED
FROM THE
LIBRARY

# කොළඹ නගරයෙහි මුඩුක්කු ප්‍රදේශයක ජීවත්වන පැල්පත්වාසීන් විධිමත් අධ්‍යාපනයට සම්බන්ධවන අයුරු

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ
අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත්
කරන නිබන්ධනය

UCLIB
384680

කර්තෘ

පී. ඩබ්ලිව්. මනතුංග

සාමාන්‍ය ශාස්ත්‍රවේදී, අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන)

UNIVERSITY OF COLOMBO
LIBRARY
SRI LANKA

384680

1982 ඔක්තෝබර්

## සංක්ෂෙපයෙන් .....

කොළඹ නගරයෙහි මුඩුක්කු ප්‍රදේශයක ජීවත්වන පැල්පත්වාසීන් විධිමත් අධ්‍යාපනයට සම්බන්ධවන ආකාරය පිළිබඳව විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය භාවිතා කොට මෙම අධ්‍යයනය කරන ලදී.

නාගරීකරණය හා ජන ප්‍රසාරණය ප්‍රමුඛ තවත් විවිධ හේතූන්වල ප්‍රතිඵලයක් වන මුඩුක්කු හා පැල්පත් බිහිවීම ලෝකයේ බොහෝ රටවල සංවර්ධනයට අදාළ ගැටළුවක් වන අතර සංවර්ධනය වන රටවල් සම්බන්ධයෙන් මේ ප්‍රශ්නය වඩාත් බරපතල ලෙස බලපායි. ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගරවලද මේ ප්‍රශ්නය දිස්වන අතර මෙහිලා කොළඹ නාගරික ප්‍රදේශයේ ඇතැම් කොටස් ප්‍රධාන වශයෙන් කැපී පෙනේ. මේ ගැටළුව විසඳීම සඳහා දැනට විවිධ වැඩ පිළිවෙලවල් ද ක්‍රියාත්මක වෙමින් පවතී. මේ කවර වැඩ පිළිවෙලක් සම්බන්ධයෙන් වුවද බලපාන මූලික ගැටළුවක් වන්නේ අදාළ මුඩුක්කු හා පැල්පත් ආශ්‍රිත පාරිසරික තත්ත්වයන් පිළිබඳ ප්‍රශ්නයයි. ප්‍රදේශවාසීන් විධිමත් අධ්‍යාපනයට සම්බන්ධවන ආකාරය පිළිබඳ ගැටළුවෙහිලාද මේ පාරිසරික සාධක වැදගත්ය.

විවිධ පර්යේෂණ වලින් හෙළිදරව් වී ඇති පරිදි අධ්‍යාපනය හා පරිසරය අතර ධන සහසම්බන්ධතාවක් පවතී. පාරිසරික යෝග්‍යතාව හෝ අයෝග්‍යතාව පිළිවෙලින් යහපත් හෝ අයහපත් අධ්‍යාපනික වාතාවරණයක් බිහි කිරීමෙහිලා බලපායි. පාරිසරික තත්ත්වයන්ගේ උප ව්‍යුහයන් වෙන වෙනම ගත් කල ඒ සෑම අංශයකම යහපත් හෝ අයහපත් ලක්ෂණයන් අධ්‍යාපනය කෙරෙහි බලපාන බවද මේ බලපෑම එක් එක් පුද්ගලයාගේ අධ්‍යාපන සාධකයන් තුළින් නිරීක්ෂණය කළ හැකි බවද හෙළිවී ඇත. මේ අනුව අයෝග්‍ය පාරිසරික තත්ත්වයකින් යුත් මුඩුක්කු ප්‍රදේශයක ජීවත්වන පැල්පත්වාසීන් විධිමත් අධ්‍යාපනයට සම්බන්ධවන ආකාරය අධ්‍යයනය කරනු සඳහා ඔවුන්ගේ පාරිසරික, සමාජ ආර්ථික හා අධ්‍යාපනික වාතාවරණයන් සහ විධිමත් අධ්‍යාපනය අතර ඇති සම්බන්ධයන්, දෙමාපියන්ගේ විධිමත් අධ්‍යාපනික අදහස් අපේක්ෂණ හා විධිමත් පාසැල කෙරෙහි ඔවුන් දක්වන ආකල්පයනුත්, පාසැල් යන දරුවන්ගේ විධිමත්-

අධ්‍යාපනික අදහස් හා විධිමත් පාසැල කෙරෙහි දක්වන ආකල්පයනුත් මෙහිලා පර්යේෂණයට ලක්වූ ප්‍රධාන තේමාවන්ය.

කොළඹ නගරයේ වනාතමුල්ලෙහි පදිංචි පැල්පත්වාසී පවුල් සියයක නියැදියක් මේ සඳහා තෝරා ගන්නා ලදී. මේ පවුල් සියය හා සම්බන්ධිත පාසැල් යන දරුවන් එකසිය හැටඑක් දෙනෙකුගේ නියැදියක් ද මෙම පර්යේෂණයට ලක් විය. ප්‍රශ්නාවලි, ආකල්ප පරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, ලේඛන සමීක්ෂණ, සහ සහභාගිත්ව නිරීක්ෂණ තුළින් දත්ත රැස්කරන ලදී.

පැල්පත්වාසීන්ගේ සමාජ ආර්ථික හා පාරිසරික තත්ත්වයන් සම්බන්ධයෙන් මෙම පර්යේෂණයෙන් හෙළිවූ කරුණු අනුව සේවා වියුක්තිය මෙම සමාජයේ මූලික ගැටළුවක් වෙයි. සේවා නියුක්ති ජනගහනයෙන් වැඩි කොටසක් ද පහළම මට්ටමේ සේවාවන්හි නිරත වූවෝ වෙති. මොවුන්ගෙන් ද නුපුහුණු ශ්‍රමිකයෝ වැඩිය.

දළ වශයෙන් මුළු පවුල් සංඛ්‍යාවෙන් සියයට 75 ක් පමණ මාසික ආදායම රුපියල් 400/= ට අඩු ආදායම් ලබන අය වන අතර, පවුල් වල වැඩි ජනගහනය විසින් මේ ප්‍රශ්නය වඩාත් සංකීර්ණ කරනු ලබයි. පවුලක සාමාන්‍ය සාමාජික ගණන හත් දෙනෙක් පමණ වේ. මුළු පවුල් සංඛ්‍යාවෙන් සියයට 93 ක් පමණ යැපෙන්නේ එක් පුද්ගලයකු උපයන ආදායමෙනි. මුළු නිවෙස් සංඛ්‍යාවෙන් සියයට 90 ක් පමණ වර්ග අඩි 200ට අඩු වන අතර මුළු නිවෙස් ප්‍රමාණයෙන් සියයට 60 ක පමණ එකම කාමරයක් වත් නොමැත. මේ නිවෙස් වල ව්‍යුහාත්මක සංයුතිය ද ඉතාමත් අසතුටුදායකය. නිවාසවලට සම්බන්ධ සෞඛ්‍ය සංරක්ෂණ විධි ඉතාමත් පහත් මට්ටමක පවතී.

මෙම සමාජ ආර්ථික අයෝග්‍යතාවන් පදනම් කරගෙන පාරිසරික තත්ත්වයන් ද නිර්මාණය වී ඇත. මෙහි පැහැදිලි ලක්ෂණය වනුයේ පරිසර පද්ධතියේ භූ භෞතික අයෝග්‍යතාවත් සමාජ මනෝ විද්‍යාත්මක අයෝග්‍යතාවන්ය. මේ තත්ත්වය කෙරෙන් පරිසරය මුදවා ගැනීම උදෙසා ක්‍රියාත්මක විය යුතු සමාජ සංවිධානයන්ද අදාළ සමාජය විසින්ම නිශ්ක්‍රිය කරනු ලැබ ඇත.

නිවෙස්හි අධ්‍යාපනික පරිසරය ද පහත් මට්ටමක පවත්නා අතර මේ තත්ත්වය අධ්‍යාපන කාර්යයන් සම්බන්ධයෙන් පැල්පත්වාසී සමාජය පසුගාමීත්වයට පත් කරයි. විධිමත් අධ්‍යාපනයේ විවිධ අංශ සම්බන්ධයෙන් දෙමාපියන්ගේ ආර්ථික තත්ත්වය බලපෑම් කරන අතර සමස්තයක් ලෙස පැල්පත් පරිසරය විධිමත් අධ්‍යාපනය සම්බන්ධයෙන් අහිතකර ලෙස බලපාන තත්ත්වයක් පවතී.

දෙමාපිය අදහස් අනුව ද මෙම තත්ත්වය තහවුරු වන අතර මොවුහු විධිමත් අධ්‍යාපනයේ ප්‍රායෝගික මුහුණුවර වෙනස් කිරීම සම්බන්ධයෙන් යම් තරමක විවේචනාත්මක අදහස් දරති. මේ දෙමාපියන්ගේ විධිමත් අධ්‍යාපනික අපේක්ෂණයන් ඉහළ මට්ටමක පැවතිය ද පවත්නා සමාජ ආර්ථික දුෂ්කරතාවයනුත් විධිමත් අධ්‍යාපනයේ ව්‍යුහාත්මක මුහුණුවරත් විසින් මේ අපේක්ෂා සාධන අවස්ථා යටපත් කර දමනු ලැබ ඇත.

විධිමත් අධ්‍යාපන පද්ධතිය පිළිබඳ දරුවන්ගේ අදහස් ද අදාළ සමාජ ආර්ථික හා පාරිසරික තත්ත්වය සහ පාඨශාලීය ක්‍රියාකාරීත්වය විසින් තීරණය කරනු ලැබ ඇති අතර ඔවුහු බොහෝ විට බලාපොරොත්තු කඩවුන තත්ත්වයකට මුහුණ පා සිටිති.

මෙම අධ්‍යයනයේදී පැල්පත්වාසීන් විධිමත් පාසැල සම්බන්ධයෙන් දක්වන ආකල්පයන් කෙරෙහි ද අවධානය යොමු වූ අතර, දෙමාපියන් වශයෙනුත්, ඔවුන්ගේ පාසැල් යන දරුවන් වශයෙනුත් ,ස්ත්‍රී පුරුෂ වශයෙන් මෙන්ම දෙමාපිය හා පාසැල් යන දරුවන් වශයෙනුත් වෙන් වෙන්ව අධ්‍යයනය කරන ලදී. මෙහිදී මොවුන් විධිමත් පාසැල සම්බන්ධයෙන් දක්වන ආකල්පයන්හි වෙසෙසි ඇමියාවක් නොමැති බව පැහැදිලි විය. මේ තත්ත්වය ස්ත්‍රී පුරුෂ වශයෙන් හෝ දෙමාපිය හා පාසැල් යන දරුවන් වශයෙන් හෝ වෙන් වෙන්ව හෝ සලකා බැලුව ද එලෙසම පවතී.

සමස්තයක් වශයෙන් ගත්කල මෙම පැල්පත්වාසී ජනතාව විධිමත් අධ්‍යාපන සම්බන්ධතාවට අදාළව අදහස්මය හා අපේක්ෂණ වශයෙන් පසු බැස්මක් නොමැති වුවද ඔවුන්ගේ සමාජ ආර්ථික හා පාරිසරික තත්ත්වයන් විසින් ඔවුන් විධිමත් අධ්‍යාපනයෙන් සැලකිය යුතු තරම් ඈත් කරනු ලබයි.

පවත්නා මෙවැනි අයහපත් තත්ත්වයන් සමහන් කිරීම හා සම්බන්ධයෙන් සලකා බැලිය හැකි යෝජනා කිහිපයක් ද මෙහිලා ඉදිරිපත් කර ඇත.